# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 අගෝස්තු මස 06 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 අගෝස්තු මස 07 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.50 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක
දෙපාර්තමේන්තුව පනත

[සහතිකය සටහන් කළේ 2009 අගෝස්තු මස 06 වන දින]

එල්. ඩී.-ඕ. 29/2007.

**වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා ද; වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය නිශ්චිතව දැක්වීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

වෙරළබඩ ප්‍රදේශවල, සමුද්‍රීය කලාපවල, ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයෙහි සහ ගැඹුරු මුහුදෙහි ආරක්ෂාව සහතික කිරීමේ කාර්යය සඳහා වෙරළ ආරක්ෂක සේවාව යනුවෙන් හඳුන්වනු ලබන බහුවිධ කාර්යය සේවාවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීමට අවශ්‍යව ඇති හෙයින් ද: පූර්විකාව.

ශ්‍රී ලංකාවට නීති විරෝධී ආගමිකයන් ඇතුළුවීම සහ විගාමිකයන් පිටවීම වැළැක්වීම සඳහාත්, මත්ද්‍රව්‍ය සහ මනෝ වර්තක ද්‍රව්‍ය ජාවාරම් කිරීම වැළැක්වීම සඳහාත්, තහනම් බඩු සහ අවි ආයුධ සොයා ගැනීම සහ තහනමට ගැනීම සඳහාත්, මුහුදේ දී ආපදාවලට ලක්වන නැව්වලට සහ එම නැව්වල සිට සොයා ගනු ලබන තැනැත්තන් සඳහා සහාය ලබා දීම සඳහාත්, සමුද්‍රීය ගමනාගමනයෙහි සුරක්ෂිතභාවය තහවුරු කිරීමට සහාය වීම සඳහාත්, සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීම සඳහාත්, සමුද්‍රීය ව්‍යසනයන් වැළැක්වීම සහ පාලනය කිරීමට කටයුතු කිරීම සඳහාත්, දේශීය සහ විදේශීය සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම සඳහාත්, එකී සියලු විෂයය පථයන්වල ජාතික සුහ සිද්ධිය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා සහ එමගින් ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව තහවුරු කර ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය සහ ජාතික ඒකාග්‍රතාවය ආරක්ෂා කිරීම සඳහාත් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව සහාය ලබා දිය යුතු හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2—PL 04111—3,500 (2009/06)

## I වන කොටස

### වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පිහිටුවීම

වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව.

**2.** (1) වෙරළ ආරක්ෂක අධ්‍යක්ෂ - ජනරාල්වරයකුගේ පාලනයට යටත් විය යුතු වන්නා වූ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවක් තිබිය යුත්තේ ය.

(2) වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව මෙම පනතේ නිශ්චිතව දක්වා ඇති බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් භාරව සිටිය යුතු අතර, වෙරළ ආරක්ෂක සේවා නිසි සහ සක්‍රීය ලෙස ඉටු කිරීම සඳහා වග කියනු ලැබිය යුතු ය.

වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පිහිටුවීම.

**3.** මුහුදුබඩ පළාත්වල, ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කලාපයේ සහ ගැඹුරු මුහුදෙහි නීතිය බලාත්මක වීම හා සම්බන්ධ වෙරළ ආරක්ෂක සේවාව යනුවෙන් හඳුන්වනු ලබන සේවාවක්, මෙම පනතේ විධිවිධාන ප්‍රකාරව පිහිටුවනු ලැබිය යුත්තේ ය.

## II වන කොටස

### වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යය සහ කර්තව්‍ය

වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යය සහ කර්තව්‍ය.

**4.** පහත දැක්වෙන දෑ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය වන්නේ ය:—

(අ) ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ නීති විරෝධී මසුන් ඇල්ලීම වැළැක්වීම සහ මුහුදේදී සහාය ලබා දීම ද ඇතුළුව ධීවරයන් ආරක්ෂා කිරීම;

(ආ) හොරෙන් භාණ්ඩ ජාවාරම් කිරීමට එරෙහිව සහ ආගමනයට එරෙහිව කටයුතු කිරීම සඳහා රේගුව සහ වෙනත් අදාළ අධිකාරීන්ට සහාය ලබා දීම;

(ඇ) මුහුදේදී සිදුවන මුහුදුකොල්ල නැවැත්වීම හෝ කළමනාකරණය කිරීම සඳහා පියවර ගැනීම;

(ඈ) සමුද්‍රීය කලාපවල සහ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයෙහි සිදුවන විනාශකාරී ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මර්දනය කිරීම සඳහා නීතිය බලාත්මක කිරීමේ ආයතන සහ සන්නද්ධ හමුදා සමග සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඉ) මුහුදු සීමාවෙන් පිට සිදුවන මත්ද්‍රව්‍ය ව්‍යාපාර වැළැක්වීම;

(ඊ) මුහුදේ දී ජීවිත හා දේපළවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අදාළ බලධාරීන්ට සහාය වීම;

(ඌ) ස්වභාවික ව්‍යවසනයන් සිදු වූ අවස්ථාවල දී මිනිසුන් සෙවීම සඳහා සහභාගි වීම සහ ආරක්ෂා කිරීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සහ එකී ව්‍යසන සහ මුහුදේ සිදුවන වෙනත් අනතුරුවලින් පසුව යාත්‍රා ගලවා ගැනීමේ සහ වෙනත් භාණ්ඩ සම්බන්ධයෙන් වූ මෙහෙයුම් සඳහා සහාය වීම;

(ඍ) සමුද්‍රාසන්න සහ සමුද්‍රීය පරිසරය සංරක්ෂණය සහ ආරක්ෂා කිරීම සඳහා සහාය වීම;

(එ) සමුද්‍ර දූෂණය සහ මුහුදේ දී සිදුවන වෙනත් ව්‍යසන වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ එම කටයුතු නියාමනය කිරීමට සහාය වීම;

(ඒ) සමුද්‍රීය සත්ත්ව හා ශාක විශේෂ සංරක්ෂණය කිරීම;

(ඔ) ස්වාභාවික ව්‍යසන අවස්ථාවල දී ගුවන් විදුලි හෝ වෙනත් ක්‍රම මගින් අනතුරු ඇඟවීම ලබා දීම ද ඇතුළුව තොරතුරු ව්‍යාප්ත කිරීම;

(ඕ) රජය විසින් දෙපාර්තමේන්තුව වෙත කලින් කල ලබා දෙනු ලැබිය හැකි හෝ පවරන ලද වෙනත් කර්තව්‍ය ඉටු කිරීම.

**5.** (1) වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට— වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ බලතල.

(අ) යම් ස්ථානයක්, ව්‍යුහයක්, යාත්‍රාවක් හෝ ගුවන් යානයක් නැවැත්වීම, එයට ඇතුල්වීම, ගොඩවීම, පරීක්ෂා කිරීම, සෝදිසි කිරීම සහ එවැනි යාත්‍රාවක් හෝ ගුවන් යානයක් අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම;

(ආ) යම් බලපත්‍රයක්, අවසර පත්‍රයක්, වාර්තාවක්, සහතිකයක් හෝ වෙනත් යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටීම සහ එකී බලපත්‍රය, අවසර පත්‍රය, වාර්තාව, සහතිකය හෝ වෙනත් ලේඛන පරීක්ෂා කිරීම හෝ එකී බලපත්‍රයේ, අවසර පත්‍රයේ, වාර්තාවේ, සහතිකයේ හෝ වෙනත් ලේඛනයන්ගේ පිටපත් ගැනීම හෝ උද්ධෘත බලා ගැනීමට;

(ඇ) සිදු කරන ලද හෝ සිදු කිරීමට අත්‍යාසන්න හෝ සිදු කරනු ලැබ ඇත්තා වූ යම් වරදක් විමර්ශනය කිරීමට;

(ඈ) උණුසුම් ලුහුබැඳ යාමේ අයිතිය ක්‍රියාත්මක කිරීමට;

(ඉ) යම් සිදු කරනු ලැබ ඇති හෝ සිදු කරනු ලැබ ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති යම් වරදක් සම්බන්ධයෙන් වූ යම් මසුන් හෝ ද්‍රව්‍ය, උපකරණ, භාණ්ඩ, යාත්‍රාවක්, ගුවන් යානයක් හෝ වෙනත් අයිතමයන් පරීක්ෂා කිරීම සහ තහනමට ගැනීම හෝ බැහැර කිරීමට;

(ඊ) ශ්‍රී ලංකාවේ තත්කාලයේ බලාත්මක වන යම් ලිඛිත නීතියක් යටතේ වරදක් සිදු කර ඇති බවට සැක කිරීමට සාධාරණ හේතු ඇති යම් තැනැත්තකු අත්අඩංගුවට ගැනීමට බලතල ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, යම් යාත්‍රාවක් දේශීය ජල තීරය තුළ යම් අවිහිංසනික යාත්‍රා කිරීමක යෙදී සිටී නම්, එවැනි කිසිම යාත්‍රාවක් දේශීය ජල තීරය ප්‍රදේශය තුළ දී අත් අඩංගුවට ගැනීම හෝ රඳවා තබා ගැනීම සිදු නොකළ යුතු ය.

මෙම වගන්තියේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ සාමයට, යථා පැවැත්මට හෝ ආරක්ෂාවට එම යාත්‍රා ගමන අහිතකර නොවන්නේ නම් එකී යාත්‍රාවේ ගමන අවිහිංසක යාත්‍රා කිරීමක් වන්නේ ය.

වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයන් සාම නිලධරයන් ලෙස සැලකිය යුතු බව.

**6.** 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සෑම වෙරළ ආරක්ෂක නිලධරයකුම සාම නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

අවි ආයුධ රැගෙන යාම.

**7.** වෙරළ ආරක්ෂක නිලධරයන් විසින් තම කාර්යය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ තාක් දුර පමණක් අවි ආයුධ රැගෙන යා හැකි ය. වෙරළ ආරක්ෂක නිලධරයන් විසින් රැගෙන යා හැකි අවි ආයුධ ප්‍රභේද, නියම කරනු ලැබිය හැකි ආකාරයට විය යුතු ය.

යාත්‍රාවක් වෙත ගොස් පරීක්ෂා කිරීමට වෙරළ ආරක්ෂක නිලධාරීන්ට ඇති බලය.

**8.** යම් වෙරළ ආරක්ෂක නිලධරයකු විසින් තම කාර්යය ඉටු කිරීමට අවශ්‍ය අවස්ථාවල දී—

(අ) යාත්‍රාවේ තිබීමට නියමිත වන්නා වූ නාවික නිල ලේඛන ඉදිරිපත් කරන ලෙසට යාත්‍රාවක නෞකාධිපතිවරයා හෝ යාත්‍රාවට අණ දෙනු ලබන වෙනත් යම් තැනැත්තකු වෙත විධාන කිරීම;

(ආ) යම් යාත්‍රාවක අනන්‍යතාවය, ලියාපදිංචි වරාය, නෞකාධිපතිවරයාගේ නම, අවසාන වරාය හෝ පිටත් වූ ස්ථානය, ගමනාන්ත වරාය හෝ ස්ථානය හෝ නැවෙහි භාණ්ඩවල ස්වභාවය විමසීමේ කාර්යය සඳහා යාත්‍රාව නැවැත්වීම, එයට ගොඩවී පරීක්ෂා කිරීම; හෝ

(ඇ) තම කාර්යය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි කාරණා පිළිබඳව යාත්‍රාවේ සේවක පිරිස සහ මගීන්ගෙන් ප්‍රශ්න කිරීම,

කරනු ලැබිය හැකි ය.

හඳුනා ගැනීම.

**9.** මේ පනත යටතේ ක්‍රියා කිරීමේ දී සෑම වෙරළ ආරක්ෂක නිලධරයකුම නිල ඇඳුමෙන් සැරසී සිටිය යුතු අතර, තමා කටයුතු කරන්නේ යම් තැනැත්තකුට එරෙහිව ද නැතිනම් තොරතුරු ඉල්ලා සිටින්නේ යම් තැනැත්තකුගෙන් ද, ඒ තැනැත්තා වෙත තමාගේ ධුරය ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා විසින් ඉල්ලා සිටීමේ දී ඒ තැනැත්තන් වෙත වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජකාරි හැඳුනුම්පත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව හෝ එහි තැනැත්තන් හමුදාමය ආයතනයක් ලෙස පුහුණු නොවිය යුතු බව.

**10.** වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව හෝ එහි තැනැත්තන් හමුදාමය ආයතනයක් ලෙස පුහුණු විය යුතු බවට හෝ සංවිධානය විය යුතු බවට හෝ එවැනි ආකාරයකට ක්‍රියාත්මක වන ලෙසට තේරුම් නොගත යුතු ය.

## III වන කොටස

### *උපදේශක සභාව*

උපදේශක සභාව.

**11.** පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන උපදේශක සභාවක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය:—

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන්, එනම්:—

(i) ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ii) ධීවර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(iii) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(iv) වරාය සහ නාවික විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(v) පරිසර හා ස්වාභාවික සම්පත් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(vi) වෙරළ ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(vii) නාවික හමුදාපතිවරයා ;

(viii) පොලිස්පතිවරයා ; සහ

(ix) වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා.

(ආ) සභාවේ සැලකිල්ලට භාජනය වී ඇති යම් නිශ්චිත කරුණක් සම්බන්ධයෙන් යම් සේවාවක් සභාවට අවශ්‍ය වී ඇති බවට අමාත්‍යවරයාට පෙනී යන අවස්ථාවක, යම් නිලධරයකුගේ සේවාව උපදේශක සභාවට ලබා දිය හැකි ය.

උපදේශක සභාවේ කර්තව්‍ය.

**12.** උපදේශක සභාව විසින් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්ෂික කටයුතු පිළිබඳ සමාලෝචනයක් සිදු කර අමාත්‍යවරයා වෙත ඒ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු බවට සභාවේ මතය වන්නා වූ ප්‍රතිපත්ති පිළිබඳව ද සභාව විසින් අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබිය යුතු ය. සභාවේ උපදෙස් යම් කාරණයක් සම්බන්ධයෙන් අපේක්ෂා කරනු ලබන ඕනෑම අවස්ථාවක දී, එම කරුණු සම්බන්ධයෙන් සභාව විසින් ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයා වෙත උපදෙස් සපයනු ලැබිය යුතු ය.

රීති.

13. උපදේශක සභාව විසින් මේ පනතේ අරමුණු ඉටු කිරීමේ කාර්යය සඳහා, එහි රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ස්වකීය රැස්වීම්වල ගණපූර්ණය සහ න්‍යාය පත්‍රය සහ

වාර්තා භාර දිය යුතු ආකාරය නිශ්චිතව දක්වමින් රීති සාදනු ලැබිය හැකි ය.

**14.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ යම් තැනැත්තකු අත්අඩංගුවට ගනු ලැබූ අවස්ථාවක දී, නීතිපතිවරයාගේ ලිඛිත අනුමතය ඇතිව මිස එම තැනැත්තාට එරෙහිව කිසිම නීති කෘත්‍යයක් පනවනු නොලැබිය යුතු ය. නීති කෘත්‍ය.

## IV වන කොටස

### සාමාන්‍ය

**15.** මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධරයන් වෙත ගෙවනු ලැබිය යුතු අතර, එකී පාරිශ්‍රමික ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය. නිලධරයන් ආදීන්ගේ පාරිශ්‍රමික.

**16.** (1) රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පිට, නිලධරයාගේ ද, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, එම දෙපාර්තමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙත තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය. වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට රජයේ නිලධරයන් පත් කිරීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට රාජ්‍ය සේවයේ නියුතු යම් නිලධරයකු දෙපාර්තමේනතුවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලබන අවස්ථාවක, එම පත්වීම, එම නිලධරයා එම පත්වීමට වහාම පෙරාතුව වූ දිනයේ දී භුක්ති විඳිමින් සිටි නියම සහ කොන්දේසිවලට වඩා අඩුවෙන් වාසිදායක නොවන්නා වූ නියම සහ කොන්දේසි මත විය යුතු ය. තව ද, එම පත්වීමේ දින සහ ඊට පසුව එම නිලධරයාට අදාළ සියලු කාරණා, කලින් කල අදාළ විය හැකි පරිදි වූ, රජයේ රෙගුලාසි මගින් පාලනය විය යුතු ය.

(3) යම් නිශ්චිත කාලයක් රජයට සේවය කිරීමට ගිවිසගෙන සිටින යම් තැනැත්තකු, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් සේවයේ යොදවනු ලබන අවස්ථාවක දී ඒ තැනැත්තා විසින් දෙපාර්තමේන්තුවේ සේවය කරන යම් කාලයක්, එකී ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා රජයට සේවය කල කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

රාජ්‍ය සංස්ථාවල නිලධරයන් සහ සේවකයන් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

**17.** (1) රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පිට එම නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව සහ එම නිලධරයාගේ හෝ සේවකයාගේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව, දෙපාර්තමේන්තුවේ සහ එම සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් එකඟ වූ රීතිවලට යටත්ව දෙපාර්තමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලබන අවස්ථාවක දී, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් කවර වුව ද සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු යටත් වන්නේ ය.

වැරදි.

**18.** ස්වකීය කාර්යය ඉටු කිරීමේ දී මෙම පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරනු ලබන යම් වෙරළ ආරක්ෂක නිලධරයකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයා විසින් පවත්වනු ලබන විභාග කිරීමකට යටත් විය යුතු අතර, එම වරද සඳහා නිශ්චිතව දක්වනු ලබන දණ්ඩනයෙන් දඬුවම් කරනු ලැබිය යුතු ය.

නියෝග.

**19.** (1) මේ පනතේ මූලධර්ම සහ විධිවිධාන බලාත්මක කරමින් සහ නියම කරනු ලැබිය යුතු යයි මේ පනත මගින් නියමිත කරුණු සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීම සඳහා බලය දී ඇති හෝ නියම කර ඇති කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් උපදේශක සභාවේ නිර්දේශ මත නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවලට අගතියක් නොමැතිව, පහත දැක්වෙන සියලු හෝ යම් කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සංයුතිය, පාලනය, සුදුසුකම්, විධාන සහ විනය;

(ආ) වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට තැනැත්තන් බඳවා ගැනීම ;

(ඇ) වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයන්ගේ සේවා කොන්දේසි ;

(ඇ) නිලධරයන්ගේ, යටත් නිලධරයන්ගේ සහ වෙනත් තැනැත්තන්ගේ තත්ත්වය, බලතල සහ අධිකාරිය ;

(ඉ) වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධරයන්, යටත් නිලධරයන් සහ වෙනත් ලැයිස්තුගත තැනැත්තන් වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් අස් කිරීම, විශ්‍රාම යෑම, මුදාහැරීම, උසස් කිරීම හෝ බැහැර කිරීම ;

(ඊ) මේ පනත යථා පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය බවට අමාත්‍යවරයාගේ මතය වන්නා වූ වෙනත් යම් කරුණක් හෝ මේ පනත මගින් විධිවිධාන සලස්වා නොමැති හෝ ප්‍රමාණවත් නොවන විධිවිධාන සකස් කර ඇත්තා වූ කරුණු සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි වන්නා වූ වෙනත් යම් කරුණු සම්බන්ධයෙන්.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒවා එම පළ කිරීමේ දින සිට හෝ නියෝගයේ නිශ්චිතව දක්වනු ලබන යම් පසුව එළඹෙන දිනයක සිට බලාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොවූ සෑම නියෝගයක්ම එම අනනුමතයේ දිනසිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට අනුයුක්ත කර ඇති වෙරළ ආරක්ෂක ඒකකය මාරු කිරීම.

**20.** ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය වෙත දැනට ඒකාබද්ධ කර ඇත්තා වූ ද කැබිනට් මණ්ඩලයේ තීරණයකට අනුව පිහිටුවා ඇත්තා වූ ද, වෙරළ ආරක්ෂක ඒකකය, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, එහි සියලු තැනැත්තන්, දේපළ, සහ වෙනත් වත්කම් ආරක්ෂක, මහජන ආරක්ෂක සහ නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යාංශය වෙත පවරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**21.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**22.** මේ පනතේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස—

"වෙරළ ආරක්ෂක නිලධරයා" යන්නෙන්, වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිත්‍ය සේවාවට අනුයුක්ත කර ඇත්තා වූ යම් තැනැත්තකු අදහස් වේ;

"සමුද්‍රීය කලාපය" යන්නට, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 22 දරන සමුද්‍රීය කලාප පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"දේශීය ජල තීරය" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඊට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.